# 11 ශ්‍රේණිය

## 1 ජුදා සමාජ දැක්ම

## 1 වන පාඩම අවබෝධ පිරික්සුම

1) බැබිලෝනියේ සිට කානාන් දේශය කරා ජන කණ්ඩායම් වල සංක්‍රමණය සිදුවූයේ කුමන සියවසේද?
2) දෙවියන් වහන්සේ හාරාන් දේශයෙන් විශේෂ කාර්යභාරයක් සඳහා කැඳවනු ලැබූයේ කවුරුන්වද?
3) ආබ්‍රහම් දෙවියන් වහන්සේගේ කාර්ය ඉටුකිරීමට පැමිණියේ කුමක් හැරදමාද?
4) ආබ්‍රහම් දෙවියන් වහන්සේ පමණක් අදහමින් ජීවිතයේ පරමාර්ථ වටහාගෙන තමන් සතු සියල්ල ඉවත දමා ඒ අනුව ක්‍රියා කිරීමෙන් අපට කුමක් පැහැදිලි වෙයිද?
5) දෙවියන් වහන්සේ හා ආබ්‍රහම්ගේ ගිවිසුමේ ඇති පොරොන්දු ගණන කීයද? ඒ මොනවාද?
6) ආබ්‍රහම්ගේ මුල් නම කුමක්ද? එහි අරුත කුමක්ද?
7) දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවට ලබාදුන් දස පණත තුළින් කුමක් තහවුරු වේද?
8) දස පණත පිළිබඳව සඳහන් වනුයේ බයිබලයේ කුමන පොතේද?
9) දස පණත තුළ ගැබ් වී ඇත්තේ මොනවාද?
10) දස පණත සඳහන් කරන්න
11) ‘පියාට හා මවට ගෞරව කරව’ යන පණත සඳහන් වනුයේ කී වෙනියටද?
12) මිනිසා හා දෙවියන් වහන්සේ අතර ඇති සබඳතාවය හා මිනිසා දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් ඉටුවිය යුතු යුතුකම් පිළිබඳව සඳහන් වනුයේ කුමන කරුණු වලටද?
13) මිනිසා හා මිනිසා අතර පැවතිය යුතු ගුණධර්ම හා මිනිස් සබඳතා පිළිබඳව කුමන පොත් වල සඳහන් වෙයිද?
14) ඇදහිල්ලේ පියා කවුරුන්ද?
15) “ආබ්‍රහම්ට කෙතරම් කාලයක් යනතුරු දරුවන් නොසිටියේ ද?
16) “ආබ්‍රහම්ගේ නාමය ආසිරි පැතීමේ නාමයක් වන බවත් ඒ තුළින් මිහිමත සියලු දෙනා දෙවියන් වහන්සේගෙන් ආසිරි ලබන බවත්ය” මින් අදහස් වනුයේ කුමක්ද?
17) ඉශ්‍රායෙල් ජනයා වහලුන් බවට පත්ව සිටියේ කොහේද?
18) දෙවියන් වහන්සේ හා ආබ්‍රහම්ට දුන් පොරොන්දු පිළිබඳව සඳහන් වනුයේ කුමන පොතේද?
19) දෙවියන් වහන්සේ ආබ්‍රහම්ට ප්‍රථමයෙන් ලබා දුන් දරුවාගේ නම කුමක්ද?
20) “පොළොවේ දූවිලි හා සමාන අහසේ තාරකා මෙන් ගණන් කළ නොහැකි තරම්” ලබා දීමට පොරොන්දු වූයේ කුමක්ද?

## 11 ශ්‍රේණිය

## 2 මෙසියස් වහන්සේ තුළින් පරිපූර්ණ ජීවිතයක්

## 2 වන පාඩම අවබෝධ පිරික්සුම

1) මෙසියස් යන වචනය හෙබ්‍රෙව් බසින් ලියන්න.
2) එම වචනයෙහි අර්ථය ලියන්න.
3) මෙසියස් යන වචනය ග්‍රීක් බසින් හා එහි අර්ථය සඳහන් කරන්න.
4) නික්මයාම 29:7 හි සඳහන් වන ලෙස ආලේප තෛලයෙන් ආලේප කරනු ලැබුයේ කවුරුන්ද?
5) ඉශ්‍රායෙල් ඉතිහාසය තුළ ආලේපනය ලැබූ ජන කණ්ඩායම් 3ක් සඳහන් කරන්න.
6) රාජාවලිය 19:16 හි සඳහන් වන්නේ කුමක්ද?
7) නිම්ෂිගේ පුත් කවුරුන්ද? ඔහුගේ තනතුර කුමක්ද?
8) රජකම හා බැඳුනු මෙසියානු සංකල්පයේ විශේෂ ලක්ෂණ මොනවාද?
9) දාවිත් රජ පරපුරෙන් පැමිණෙන මෙසියස් වහන්සේ පිළිබඳ ඉඟියක් දැක්වූයේ කවුද?
10) මෙසියස් වහන්සේ තම රාජ්‍යත්වය ඉස්මතු කරන්නේ කුමක් පදනම් කරගෙනද?
11) මෙසියස් වහන්සේගේ අරමුණ කුමක්ද?
12) යෙසායා දිවැසිවරතුමාගේ කාලයේ අසිරියාවෙන් බලවත් තර්ජන එල්ල වී තිබුණේ කුමන රාජ්‍යයටද?
13) යෙසායා 9:4 සඳහන් වන පරිදි යෙසායා තුමා ජනතාවට පවසනුයේ කුමක්ද?
14) මෙසියස් වහන්සේ තුළින් ලැබෙන පරිපූර්ණ ජීවනයන් මොනවාද?
15) ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් උන් වහන්සේ මෙසියස් වහන්සේ ලෙස හඳුන්වා ගත්තේ යැයි ධැක්වනුයේ බයිබලයේ කුමන පොතේද?
16) ක්‍රිස්තුස් වහන්සේ තමන් මනුෂ්‍ය පුත්‍රයාණන් ලෙස හඳුන්වා ගනිමින් ප්‍රකාශ කළේ කුමක්ද?
17) මිනිසා සියලු අන්දමේ වහල් බැඳීම් හා පීඩනවලින් නිදහස ලැබුවේ කුමක් නිසාද?
18) දේව රාජ්‍යයේ වටිනාකම් මොනවාද?
19) යෙසායා 11:19 හි සඳහන් වන පරිදි මෙසියස් වහන්සේ උදාකල සාම රාජ්‍යයේ ලක්ෂණ මොනවාද?
20) වර්ථමාන කාලයේ මෙසියානික රාජ්‍ය පහළවීමට බාධා කරන කරුණු 4 ක් සඳහන් කරන්න

## 11 ශ්‍රේණිය

## 3 යහපත් බැටළු එඬේරා

## 3 වන පාඩම අවබෝධ පිරික්සුම

1) එඬේර ජීවිත ගත කළ අය කවුරුන්ද?
2) ඉශ්‍රායෙල්වරු දෙවියන් වහන්සේ තම එඬේරාණන් ලෙස සැළකීම පිළිබඳ සඳහන් වනුයේ කුමන පොතේද?
3) ගීතාවලිය පුස්තකය ලියනු ලැබුයේ කුමන ශතවර්ෂයේද?
4) යේසුස් වහන්සේ යහපත් බැටළු එඬේරාණන් ලෙස ඉගැන්වූයේ මොන පොතේද?
5) එඬේර චරිත ගුණාංග මොනවාද?
6) එසකියෙල් 34:16 පදයෙහි සඳහන් වනුයේ කුමක්ද?
7) සිය දණ්ඩෙන් හා සැරයටියෙන් මඟ පෙන්වන එඬේරා ගැන සඳහන් වන පොත කුමක්ද? කීවෙනි පාඨයද?
8) දාවිත් රජු ගීතාවලිය 23:4 සඳහන් කරන්නේ කුමක්ද?
9) "සතුරන් ඉදිරියේදී මංගල බොජුනක් පිළියෙල කරදීම" යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
10) ඉන් මතුවන වැදගත් කාරණය කුමක්ද?
11) "ජේසුස් වහන්සේ සිය පියාණන් ඉතා ගැඹුරු ලෙස හඳුනන්නාක් මෙන් එඬේරාණන් ද සිය බැටළුවන් හඳුනන" බව පවසනුයේ කවුරුන්ද?
12) එඬේරුන් ලෙස අප ක්‍රියා කල යුත්තේ කෙසේද?
13) ප්‍රේමයේ මූලිකාංග මොනවාද?
14) අපගේ යහපත් එඬේරාණන් කවුද?
15) ජොහාන් 10:16 වන පදයෙහි සඳහන් වන්නේ කුමක්ද?
16) බැටළුවන් ලෙස අප ක්‍රියා කල යුත්තේ කෙසේද?
17) ජොහාන් 10:8 හි සඳහන් වන්නේ කුමක්ද?
18) "සොරා එන්නේ සොරකම් කරන්ටත්, මරන්ටත්, විනාශ කරන්ටත් පමණි" මෙය සඳහන් වනුයේ කුමන පොතේද?
19) "මා පැමිණියේ ඔවුන් හට ජීවනය ලැබෙන පිණිසය. සපුරාම එය ලැබෙන පිණිසය" යනුයෙන් එවසනුයේ කවුද?
20) දේව වචනයේ සඳහන් එඬේර චරිත ගුණාංග සිය ජීවිතයෙන් දැක්වූ ඔබ දන්නා මෑත කාලීන නායකයන් දෙදෙනෙක් සඳහන් කරන්න.

## 11 ශ්‍රේණිය

## 4 දුක් උසුලන සේවකයාණෝ

## 4 වන පාඩම අවබෝධ පිරික්සුම

1) ජෝබ් පොත තුළ ජෝබ්ගේ චරිතය දෙවියන් වහන්සේ තුල කෙබඳු ආකාරයේ චරිතයක්ද?

2) දෙවියන් වහන්සේ තුළ ජෝබ්ගෙ ඇදහිල්ල සෙලවීමට සාතන් එවූ බාධාවන් මොනවාද?

3) ජෝබ්ගෙ ජීවිතය තුලින් ගත හැකි ආදර්ශ මොනවාද?

4) ජෙරමියා සිටි දේශපාලන පරිසරය කිනම් අධිරාජ්‍යයකට යටත් වූවක්ද?

5) අනාවැකි කියන්නෙක් ලෙස ජෙරමියා ජුදා ජනතාව හට පැවසූ අනාවැකි මොනවාද?

6) මෙම අනාවැකිය හේතුවෙන් මොහුට දුන් දඬුවම හා එයින් ගැලවුන අන්දම පහදන්න.

7) ජෙරමියා තුල ඇති ජීවිත ආදර්ශය කුමක්ද?

8) ජුදෙව්වන් බලා සිටි මෙසියස් කිනම් ආකාරයේ කෙනෙක්ද?

9) යෙසායා තුමා පැවසූ ලෙස මෙසියස් කිනම් ආකාරයේ අයෙක්ද?

10) නව ගිවිසුමෙහි සඳහන් පරිදි දුක් විඳින සේවකයාණන්ගේ කාර්ය සම්පූර්ණ කරන්නේ කවුද?

11) ජේසුස් වහන්සේගේ දුක් විඳීමේ ප්‍රථිඵලය වූයේ කුමක්ද?

12) දුක් විඳින සේවකයාණන් හා අප ක්‍රියා කල යුත්තේ කෙසේද?

13) සේවයේ ප්‍රධාන අංග මොනවාද?

# 11 ශ්‍රේණිය

# 5 ප්‍රේමයෙන් දිවි ගෙවමු

# 5 වන පාඩම අවබෝධ පිරික්සුම

1) දේව ප්‍රේමය තුලින් ඇත්වන කරුණු මොනවාද?

2) ලොව සදහටම පවතින ධර්මතාව වන්නේ කුමක්ද?

3) පාවුලු තුමා විසින් කොරෙන්ති වාසීන්ට පැවසූ අන්දමට ප්‍රේමයේ ස්වභාව ඔබ සිතනා ලෙස කෙබඳුද?

4) මාක් සුභාරංචියට අනුව ප්‍රේමය සම්බන්ධව ශ්‍රේෂ්ඨතම ආඥා 2 කුමක්ද?

5) පාවුලු තුමා විසින් එපීස වාසීන්ට පෙන්වා දෙන ලෙස ප්‍රේමයේ පදනම මත ජීවිතය ගොඩනැගී ඇතිවිට එය සවිමත් කරගත හැක්කේ කුමකින්ද?

6) එවැනි ජීවිතයකට ජේසුස් වහන්සේ තුල ස්ථිර වීමටත් ප්‍රේමයෙහි ස්ථිරව සවිමත් වීමටත් අවශ්‍ය වන්නේ කුමක්ද?

7) එකල ඊශ්‍රයෙල් සමාජයේ හෙළා දැකූ ක්‍රියාවක් නම් කර ජේසුස් පිලිගත් කණ්ඩායමක් නම් කර අද සමාජයට එය ගලපන්න.

8) ප්‍රේමයේ පදනම කුමක්ද?

9) ප්‍රේමය වඩාත් අර්ථවත් වන්නේ කුමක් සිදු කිරිමෙන්ද?

10) ජේසුස්ගේ ප්‍රේමය කෙබදු ආකාරයේද?

**11 ශ්‍රේණිය**

## 6 සාමයට කැපවෙමු

## 6 වන පාඩම අවබෝධ පිරික්සුම

1) කන්ද උඩ දේශනයට අනුව දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නේ කාටද?

2) යුක්තිය උදෙසා පීඩා විඳින්නන්ට හිමිවන්නේ කුමක්ද?

3) සාමය කිරීම තුල ඇති දේව අභිමතය කුමක්ද

4) වර්තමානය තුලදී සාමය කඩ වී ඇති අන්දම පහදන්න

5) අනාගතවක්තෘ යෙසායා පවසන ලෙස ජේසුස් වහන්සේගේ සාම රාජ්‍යය තුල ඇති වටිනාකම් මොනවාද?

6) යුක්තිගරුක භාවය ඇතිවීම ප්‍රධාන ලක්ෂණයක් වන්නේ කුමන ආකාරයෙන් බිහිවන රාජ්‍යයක් තුලද?

7) සාමය පැතීමට ප්‍රදෙව්වන් හා මුල් කිතුනුවන් පුරුදුව සිටි හෙබ්‍රෙව් වචනය කුමක්ද? සම්පූර්ණ

8) සාමය සඳහා "අයිරේනියා" යන වචනය යොදාගන්නේ කුමන භාෂාවේද?

9) සමාජ සාධාරණත්වය හා ලක් කිතුණු සසුන තුල සාමය වෙනුවෙන් කැපවූ පූජකවරු දෙදෙනෙක් නම් කරන්න

10) ගරු චන්ද්‍ර ප්‍රනාන්දු පියතුමාගේ සේවයෙහි පදනම කුමක්ද?

11) ගරු තිස්ස බාලසූරිය පියතුමා ලියූ කෘතිවල සඳහන් වන්නේ කුමක්ද?

12) පැල්පත් වාසීන් පිළිබඳ තැවුණු තිස්ස බාලසූරිය පියතුමා ඔවුන්ගේ දිළිඳු බව හා නිවාස ප්‍රශ්නය සඳහා කුමක් කලේද?

13) මුළු ලොව පාපයෙන් ගලවා ගන්නා පිණිස මාංශවත්ව මෙලොවට වැඩමකල දේව පුත්‍රයන් බයිබලයේ කෙසේ හඳුන්වයිද?

# 11 වන ශ්‍රේණිය
# 7. කමාව අත් දකිමු
# 7 වන පාඩම අවබෝධ පිරික්සුම

1) සමාජයට දේව ගුණාංගයක් වන කමාව දීමේ ගුණාංගය හඳුන්වා දුන්නේ කවුරුන්ද?

2) ස්වාමීන්ගේ යාච්ඤාවට අනුව අප කමාව ලබාගැනීම සඳහා කුමක් කල යුතුද?

3) ජේසුස් වහන්සේ තම ජීවිත ආදර්ශයෙන් අන්අයට කමාව දුන් අවස්ථාවක් නම් කරන්න

4) පේදුරු තුමා පවසන ලෙස යුදෙව් පිලිගැනීමට අනුව අප කීවරක් සමාව දියයුතුද?

5) තමාගේ දිවියට ආ පීඩාවලදී සමාව දානය කල දේවගැතිවරු දෙදෙනෙකු නම් කරන්න

6) කිතුනුවන් වන අපහට තම වරද පිළිබඳව පසුතැවිලි වී අලුත් ජීවිතයක් ඇරඹීමට හැකි බව පැවසුවේ කවුද? ඒ කෙසේද?

7) කමා වීමේ වැදගත්කම පෙන්වීම සඳහා උපමාවක් ලියන්න

8) කමා නොවූ දාසයා පිළිබද උපමාවෙන් ලැබිය හැකි ආදර්ශ දක්වන්න.

# 11 ශ්‍රේණිය

## 8 ඒකත්වයෙන් දිවි ගෙවමු

## 8 වන පාඩම අවබෝධ පිරික්සුම

1) විවිධත්වය කිතුණු ජීවිතයට වැදගත්ය. පහදන්න.
2) මිදිවැලෙහි උපමාවට අනුව දෙවියන් වහන්සේ අප හා සම්බන්ධ වූයේ කෙලෙසින්ද?
3) මිදිවැලෙහි උපමාවට අනුව මේවා හඳුන්වා දෙන්න

   මිදිවැල -

   මිදි අතු -

   උද්‍යාන පාලකයා-

4) දේව කැමැත්ත ලෙස කිතුණු අප මෙලොව විසිය යුත්තේ කෙසේද ?

5) යම් කෙනෙකුට ජේසුස් සමග බද්ධ විමට නොහැකි නම් ඔහුට කුමක් සිදුවේද?
6) ඵල නොදරන අතු ලෙස හඳුන්වන්නේ කවුරුන්ද ඔවුන්ට කුමක් සිදුවේද?
7) අද ලෝකයේ ඒකත්වයට ඇති බාධා මොනවාද?
8) සභාවක් ලෙස හා කිතුණුවන් ලෙස අප ජේසුස් වහන්සේ සමඟ සිටිය යුත්තේ කෙලෙසද?
9) කිතුණු සභාව තුල ඒකත්ව වර්තමානය තුල පළුදුව ඇති ආකාරය පහදන්න
10) අප ඒකත්වයෙන් සිටින විට දෙවියන් වහන්සේගෙන් ජේසුස් වහන්සේ ලද කුමක් සම්පූර්ණ වන්නේද?
11) වර්තමානයේදී සභා එකමුතුව සඳහා උත්සාහ දරන සංවිධාන මොනවාද?
12) විවිධත්වය හා වෙනස්කම් මධ්‍යයේ ඒකත්වයෙන් සහෝදරත්වයෙන් බැඳී කටයුතු කිරීමෙන් අපට හිමිවන්නේ කුමක්ද?
13) පාවුල් තුමා එපීස වරුන්ට යැවූ පත්‍රයේ තිබූ පරිදි ජේසුස් වහන්සේ ජුදෙව් හා විජාතීන් අතර තිබූ සම්බන්ධතාව කෙසේ අවධාරණය කලේද?

## 11 ශ්‍රේණිය

## 9. බලාපොරොත්තුව හා සදාතන ජීවනය

## 9 වන පාඩම අවබෝධ පිරික්සුම

1) කිතුනුවන් වන අපහට මෙලොව ලෞකික බලාපොරොත්තු වලට එහා ගිය අනර්ඝ බලාපොරොත්තුක් ඇත. ඒ කුමක්ද?
2) දේව බලාපොරොත්තුවක් ලබා ගැනීමට බොහෝ දේ ඉවසිය යුතුය. ඒ මොනවාද?
3) එලෙස දේව බලාපොරොත්තුව ලබාදීමට දෙවියන් වහන්සේ විසින් තෝරාගත් මනුෂ්‍යන් දෙදෙනෙක් නම් කරන්න
4) ආත්මාර්ථයෙන් තොරවූ කිතුනුවන්ගේ බලාපොරොත්තුව කුමක්ද?
5) එම බලාපොරොත්තුව ඉෂ්ඨ කර ගැනීමට දෙවියන් වහන්සේ අප හට ප්‍රධානය කලේ කුමක්ද?
6) සදාකාල ජීවනය ලබා ගැනීමට අප තුල ජීවිත පරිවර්තන 3 ක් සිදුවිය යුතුය. ඒ මොනවාද?
7) අප හට ධර්මිෂ්ඨකම හිමිවන්නේ කුමක් හේතුවෙන්ද?

8) ධර්මිෂ්ඨකම අත්කරගත හැකි සැලැස්මක් ඇත. එය පියවර වශයෙන් දක්වන්න
9) ශුද්ධකම යනු කුමක්ද?
10) ශුද්ධකමෙහි ජීවිතයක ලක්ෂණ මොනවාද?

## 11 ශ්‍රේණිය

## මුල් කිතුණු සභාවෙන් ආදර්ශයක්

## 10 වන පාඩම අවබෝධ පිරික්සුම

1) පිරිසක් රැස් වන ස්ථානයක් කිනම් නමින් හඳුන්වයිද?

2) කිතුණු සභාව යනු කුමක්ද?

3) පෙන්තකොස්ත මංගල්‍යය යනු කුමක්ද?

4) ගෝලයන් සහ පිරිස ජෙරුසලමෙහි උඩු මහලෙහි යාච්ඤා කරමින් සිටියදී කුමක් සිදු වූයේද?

5) එහිදී විශේෂ සිදුවීම් කිහිපයක් සිදුවුනි ඒ මොනවාද?

6) මුල් කිතුණු සභාවෙහි කොටස් දෙකකි. ඒ මොනවාද?

7) ශුද්ධාත්ම දානයෙන් පසු කිතුණුවා නව ජීවිතයක් ලැබූ අතර සිය ආත්මික වර්ධනය උදෙසා පිලිවෙත් ඉටු කලේය. ඒ මොනවාද?

8) ජේසුස් වහන්සේගේ උත්ථානයෙන් පසු හා ස්වර්ගාරෝහණයෙන් පසු එක්වූ ඇදහිලිවතුන්ගෙන් ගොඩනැගුනු කිතුණු සභාවේ ලක්ෂණ ලියන්න

9) නමස්කාර ජීවිතය තුල ආදර්ශමත් කිතුණුවා හැසිරිය යුත්තේ කෙසේද?

10) මුල් සභාවේ ධර්මදූත මෙහෙවර දියත් කලේ කවුරුන්ද?

11) ධර්මදූත සේවයෙහි අංග 2 කි. නම් කරන්න

12) ධර්මදාන මෙහෙවරෙහි අංග මොනවාද?

13) සුභසාධන සේවයෙහි වටිනාකම් රැසකි. ඉන් කිහිපයක් පහදන්න.

## 11. ඵලදායී මෙහෙවරක්

1) ජේසුස් වහන්සේ තම කිතුණු සභාව ඔහු මත ගොඩනගනවා යැයි පවසමින් 'පර්වතය' නැතිනම් 'කේපස්' යන නාමයෙන් හැඳින්වූ ගෝලයා කවුරුන්ද?
2) ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේ ගේ ක්‍රිස්තුවරයාණෝ බව ප්‍රකාශ කල ප්‍රථම ශ්‍රාවකයා වන්නේ කවුරුන්ද?
3) ජේසුස් වහන්සේ නාඳුනන බව තෙවතාවක් පැවසූ ගෝලයා කවුරුන්ද?
4) ජේසුස් වහන්සේගේ ස්වාර්ගාරෝහණයෙන් පසු මුල් සභාවේ මූලිකත්වය ගෙන ක්‍රියා කලේ කවුරුන්ද?
5) පේදුරු තුමාගේ දේශනා ශෛලිය කෙබඳු එකක් වීද?
6) පේදුරු තුමාගේ ප්‍රබල දේශනාවෙන් ගත හැකි දේ විමසන්න
7) අපෝස්තුලුවරු විසින් සිදුකල ප්‍රථම සුවකිරීම කුමක්ද?
8) එම සුවකිරීම සිදුකල අපෝස්තුලුවරු දෙදෙනා කවුරුන්ද?
9) එයින් ගත හැකි ආදර්ශ මොනවාද?
10) පේදුරු තුමාට පැමිණී අභියෝගයක් නම්කර එය ජයගත් ආකාරය පහදන්න
11) පේදුරු තුමාගේ ජීවිතයෙන් ඉගෙන ගත හැකි දේ,

## 12 .ජීවිත වෙනසක්

1) විජාතීන්ගේ අපෝස්තුළු ලෙස විරුධාවලිය ලැබුවේ කවුරුන්ද?

2) පාවුලු තුමා නව ගිවිසුම තුළ රචනා කර ඇති ග්‍රන්ථ ගණන වන්නේ?
3) " නාමයන් පිළිවෙලින් ලියන්න
4) සාවුල්ගේ උපත සිදුවූයේ කොහේද?
5) එම නගරයෙහි පසුබිම පහදන්න
6) පාවුලු තුමා අයත් ගෝත්‍රය කුමක්ද?
7) පාවුලු තුමා උසස් අධ්‍යාපනය ලැබූයේ කා යටතේද?
8) පාවුලු තුමාගේ වෘත්තීය පසුබිම කුමක්ද?
9) 'පරිසි' යන්නෙහි අර්ථය කුමක්ද?
10) රෝම පුරවැසියෙකු වීමේ වාසිය පාවුලු තුමාට කිනම් අයුරෙන් ලැබුනේද?
11) පරිසිවර සාවුල් කෙබඳු අයෙක්ද?
12) ප්‍රථම වේදසාක්ෂික වූ ස්තේපන් තුමාගේ මරනයේදී ගල් ගසන්නන්ගේ සළු කවුරුන් රක්ෂා කලේද?
13) ජුදෙව් පීඩා මධ්‍යයේ කිතුනුවා විසිරුණු අතර ඔවුන්ට "ක්‍රිස්තියානි" යන නාමය ලැබුණු සභාවෙහි නාමය කුමක්ද?
14) පාවුල් තුමාගේ ජීවිත පරිවර්ථනය සිදුවූ ස්ථානය නම් කරන්න
15) එහිදී ජේසුස් වහන්සේගේ පහදා දීමෙන් පසු අන්ධවූ පාවුල් හට සුවය ලබා දුන්නේ කවුරුන් විසින්ද?
16) ජේසුස් වහන්සේගේ සේවයට කැපවූ සාවුල්ගේ මෙහෙවර කුමන ආකාරයේ එකක් වීද?

## 13 හවුල් නායකත්වයේ ජය

1) පාවුල් තුමා ජෙරුසලමෙහි ශ්‍රාවකයන් හට හඳුන්වා දුන්නේ කවුරුන් විසින්ද?
2) අන්තියෝකිය සභාව කෙබඳු සභාවක් දැයි පහදා එහි මූල්කත්වය ගෙන සේවය කර ගුරුවරු දෙදෙනෙක් නම් කරන්න
3) කිතුණුවන් හට පළමුව 'ක්‍රිස්තියානි' යන නාමය ලැබුනේ කෙහේදීද?
4) පළමු ධර්මදූත ගමනට සහභාගී වූවන් කවුරුන්ද?
5) බාර්ණබස් තුමා උපන් නගරය හා ජොහාන් මාර්ක් සේවයට කැපවූ නගරය කුමක්ද?
6) බොරු අනාගත වක්තෘ කෙනෙක් වූ බාර් ජේසුස් හෙවත් එලිමස්ගෙන් සර්ගියස් පාවුලස් නම් දේශාධිපතියා පාවුල් තුමා විසින් හඳුන්වාගත් ස්ථානය කුමක්ද?
7) පම්පිලියේ පර්ගාවේදී සිදුවූ වැදගත් සිද්ධියක් නම් කරන්න
8) පිසිදියේ අන්තියොකියේදී පාවුල් තුමාගේ දේශනාවෙහි අන්තර්ගත කරුණු අයත් වන්නේ කුමන කාලයටද?
9) ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණව හවුල් නායකත්වය තුළකල දේශණා තුලින් අත්කර ගත් යහලත් ප්‍රතිඵල මොනවාද?
10) පාවුල් තුමා හා බර්ණබස් තුමා දේවත්වයෙන් සැලකූ නගරය කුමක්ද?
11) එම දේවත්වයෙන් සැලකූ නගරයේදී පාවුල් තුමා හා බර්ණබස් තුමා ක්‍රියාකල ආකාරය පහදන්න
12) සුභසුන දෙසීම තුලින් බොහෝ දෙනෙකු ශ්‍රාවකයන් වූ නගරය කුමක්ද?
13) ජෙරුසලම් මන්ත්‍රණ සභාව තුල මූලිකත්වය ගෙන කටයුතු කලේ කවුරුන්ද?
14) මන්ත්‍රණ සභාව තුලදී පැන නැගුණු ගැටළුව කුමක්ද? මුලසුනෙහි සිටි අය ක්‍රියාකල ආකාරය පහදන්න

## 14 දිරියෙන් යුතු මෙහෙවර

1) පාවුල් තුමා හා බර්ණබස් තුමා අතර ඇතිවූ ගැටුමට හේතුව කුමක්ද?
2) දෙවන ධර්මදූත ගමනට සහභාගි වූවෝ කවරහුද? ඔවුන් මෙමෙ ගමනේදී ඉටුකල සුවිශේෂී කාර්ය්‍යය කුමක්ද?
3) පහත සඳහන් ස්ථාන වලදී සිදුවූ විශේෂ සිදුවීම් සඳහන් කරන්න
    - දර්බය හා ලුස්ත්‍රාව
    - පිලිප්පිය
    - ඇතෑන්ස්
    - කොරින්තිය
4) පාවුල් තුමාගේ රැකියාව කුමක්ද?
5) දෙවන ධර්මදූත ගමන තුල පාවුල් තුමා මුහුණ දුන් අභියෝග කවරේද?
6) මෙම පාඩම තුලින් ඔබ ඉගෙන ගත් පාඩම් මොනවාද?

## 15 අභියෝග මැද මෙහෙවර

1) තුන්වන ධර්මදූත ගමනට සහභාගී වූවෝ කවුරුද?
2) එපීසය තුලදී සිදුවූ විශේෂ සිදුවීම් සැකෙවින් ලියන්න
3) මෙම අභියෝග හමුවේ ඔවුන් අත්දුටු ප්‍රතිඵල මොනවාද?
4) ඔබගේ ජීවිතයේ අභියෝග ජය ගැනීමට එපීසයේ සිදුවීම තුල පාවුල්තුමා ක්‍රියාකල ආකාරය කෙතරම් දුරට උපකාර වේද? කෙටියෙන් පහදන්න

## 16 සාක්ෂියේ දිරියෙන් මෙහෙවර

1) අගබස් නම් දිවැසිවරයාගේ ප්‍රකාශය (තුන්වන ධර්මදූත ගමනට අදාළව) සඳහන් කරන්න
2) ජෙරුසලමේ නායක පූජකයන් හා ජුදෙව්වරුන් පාවුල්තුමාට කිරීමට උත්සාහ කලේ කුමක්ද?
3) පාවුල් තුමා සිරකරුවෙකු ලෙස සිටියදී ඉශ්ට කරගැනීමට ආශාවෙන් සිටි බලාපොරොත්තුව කුමක්ද?
4) රෝමයට යන ගමනේදී ඔවුන්ට මුහුණ පෑමට සිදුවූ කුණාටුව කුමක්ද?
5) මෝල්ටාවේදී පාවුල් තුමාගේ සාක්ෂි දීමේ සිදුවීම කෙටියෙන් ලියන්න
6) රෝම ගමනේදී පාවුල් තුමාගේ සාක්ෂි දැරීමේ සිදුවීම ආදර්ශයට ගන්නා ඔබ, ඔබගේ ජීවන අභියෝග හමුවේ ක්‍රියාකල යුත්තේ කෙසේද? පහදන්න

## 17 ක්‍රිස්තුස් වහන්සේට අයත් මම

1) සිනගෝගවල ඉගැන්වූ ජේසුස් වහන්සේ හට ජුදෙව් ජනතාව විසින් ආමන්ත්‍රණය කලේ කෙසේද?
2) නිකදේමුස් යනු කවර ආකාරයේ පුද්ගලයෙක්ද?
3) නිකදේමුස් ජේසුස් වහන්සේ හමුවීම තුලින් ගම්‍ය වන දේ කෙටියෙන් පහදන්න
4) "යමෙකු නැවත නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැකගත නොහැකිය" යන නිර්වචනය තුලින් ජේසුස් වහන්සේ නිකදේමුස් හට පැහැදිලි කල දේ කෙටියෙන් පහදන්න
5) දේව රාජ්‍යයේ උරුමක්කාරකම මෙලොවදීම ලබා ගැනීම සඳහා මිනිසා විසින් කුමක් කළ යුතුද?
6) "අලුත් ඉපදීමක් " ලබාගැනීමට අප කුමක් කළ යුතුද?
7) ජුදෙව්වන් හා සමාරිතයන් අතර කෙබඳු සම්බන්ධයක් වීද?
8) ජේසුස් වහන්සේ සමාරිය ස්ත්‍රිය සමඟ කටයුතු කල අවස්ථාවේදී වර්ථමාන ජනතාවට ගත හැකි ආදර්ශය පැහැදිලි කරන්න
9) ජේසුස් වහන්සේ "ආත්මික පිපාසය" හෙලිකිරීමට යොදාගත් "මිනිස් අවශ්‍යතාව" කුමක්ද?
10) ආකල්ප වෙනසක් මඟින් "සදාකාල ජීවනය"හිමිකරගත් දෙදෙනෙක් නම් කරන්න

## 18 ක්‍රිස්තුස් වහන්සේට අයත් අප

1) පවුලේ නිර්මාතෘවරයාණෝ කවුරුද?
2) ලොව ප්‍රථම මිනිසා සහ ස්ත්‍රිය නම් කරන්න
3) "ඒව" යන නාමයේ අර්ථය සහ "ආදම්" යන නාමයේ අර්ථය කුමක්ද?
4) කිතුණු භාර්යාව සහ ස්වාමි පුරුෂයාගේ වගකීම් පැහැදිලි කරන්න
5) ස්ත්‍රිය සහ පුරුෂයා යටත්ව ජීවත් වීම තුළ "යටත් වීම" යනු යටත් කරනොගන්නා පදයකි. මෙහි "එකිනෙකාට යටත් වීම" යන්න කෙලෙස වීද?
6) භාර්යාව සහ ස්වාමි පුරුෂයා අතර ප්‍රේමය එපීස යැවුම් පත්‍රයේ සඳහන් වන පරිදි කෙබඳු විය යුතුද?
7) එපීස 6:13 සඳහන් වන පරිදි දරුවන් හට පැවරී ඇති වගකීම් මොනවාද?
8) දෙවියන් වහන්සේ විසින් පවුලක් හට ලබාදෙන තිලිණය වන්නේ කුමක්ද?
9) දෙමාපියන් හට දරුවන් වගකීමක් වන අතර එම වගකීම හඳුන්වන්න
10) කොලොස්සි හි සඳහන් පරිදි කිතුණුවකු තුල තිබිය යුතු ජීවිත ප්‍රතිපත්ති මොනවාද?
11) කිතුණුවක් ලෙස අප සමාජයේ හැසිරිය යුත්තේ කෙලෙසද? එමෙන්ම මුහුණ දෙන ගැටලු හමුවේ ක්‍රියා කල යුතු ආකාරය පහදන්න
12) කිතුණු ජීවිත වල ප්‍රධාන අරමුණ කුමක්ද?

## 19 සහජීවනයේන් ගොඩ නැගෙමු

1) කිතුණුවන් වන අපගේ කැඳවීම තුල ඇති මෙහෙවර කුමක්ද?
2) දේව කැමැත්ත ඉටුකිරීම තුලදී අපගේ ජීවිත මාර්ගවල ස්වභාවය කෙබඳුද?
3) අපගේ දීමනා දෙවියන් වහන්සේ විසින් අපට ලබාදෙනු ලැබුවේ මෙලොව තුලදී කුමක් කිරීමටද?
4) සහජීවනයෙන් හා කිතුණුවෙකු ලෙස ජීවත් වීමේදී අපට පැමිණෙන අභියෝග කිහිපයක් ලියන්න
5) කිකුණුවකු ලෙස කිතුණු අනන්‍යතාව සුරකිමින් එම අභියෝගවලට මුහුණ දෙන ආකාරය පහදන්න
6) එලෙෂ විවිධ අභියෝග මධ්‍යයේ රෝගීන්ට හා ජනතාවට උදව් කළ මව්තුමියක් නැතිනම් කිතුණු නායකතුමියක් නම් කරන්න
7) ඇය සමාජය තුල ක්‍රියාකල ආකාරය පහදන්න

## 20 ආත්මයාණන්ගෙන් දිවිමඟ ලබමු

1) රෝම 12:1 ලියා කටපාඩම් කරන්න
2) ශුද්ධාත්ම ඵල නම් කරන්න
3) වර්තමාන තරුණ පරපුර වරදට පෙළඹීමට බලපාන හේතු කවරේද?
4) ශුද්ධාත්මයාණන් වහන්සේ දුක්කරන අප තුළ තිබෙන දුර්වල ගුණාංග කවරේද?
5) ශුද්ධාත්මයාණන් වහන්සේ සමඟ එකඟව ජීවත් වීමට ඔබට තුළ ගොඩනගා ගත යුතුදේ මොනවාද?

## 21 දරිද්‍රතාවයේ අභියෝගය ජයගනිමු

1) සමාජයෙහි පවතින දිළිඳු බව කිතුණුවන් වන අපට කොටස් දෙකකට බෙදිය හැක. එම කොටස් දෙක නම් කරන්න
2) කිතුණුවන් වන අපට ආර්ථිකව දිළිඳු අයට ශක්තිමත් විය හැකි ආකාරය පහදන්න
3) අලසව හා අනුන්මත යැපෙමින් ජීවත්වන්නාට කුමක් හිමිවන්නේද?
4) රටක් ලෙෂ සියලු සම්පත් නිසිලෙස බෙදාදීමෙන් ලෞකික දිළිඳුකම මඟහැරෙනා ආකාරය පහදන්න
5) දිළිඳු කම ලොවපුරා ව්‍යාප්තියට අහිතකර හැසිරීම් බලපායි. එවැනි අහිතකර හැසිරීම් කිහිපයක් නම් කරන්න
6) ලෞකික දිළිඳුකම මඟහරවා ගැනීමට අප ආත්මිකව කටයුතු කල හැකි ආකාරය පහදන්න
7) ස්වර්ගික සදාකාලික ජීවිතය උරුම කරගැනීමට අප මෙලොව රැස්කල යුතු වස්තුව කුමක්ද?
8) "තණ්හාව" හේතුවෙන් සිදුවන සමාජීය වෙනස පහදන්න
9) ඉහත සමාජ වෙනස නිසා ඇතිවන දිළිඳුභාවය නම් කරන්න
10) අධ්‍යාත්මික දිළිඳුබව  බව විග්‍රහ කිරීමට ජේසුස් වහන්සේ ඉදිරිපත් කල උපමා මොනවාද? ඒවායෙද් ගතහැකි ආදර්ශ වෙන වෙනම පහදන්න
11) දේව රාජ්‍යයේ සැබෑ පොහොසත් කම ලබා ගැනීමට අප අත්හල යුතු අයහපත් ගුණාංග මොනවාද?

# 22 පීඩිතවූවන් මුදවාලමු

1) දෙවියන් වහන්සේ අපට දුන් මෙම ලෝකය විනාශ වීමට බලපා ඇති ප්‍රධානම කාරණාව වන්නේ මොනවාද?
2) මිනිසා ආගාධයට පත්වී ඇති අයහපත් ආකල්ප මොනවාද?
3) දෙවියන් වහන්සේ විසින් පීඩාව අනුමත නොකල අතර මිසරයේ වහල් වූ ඉශ්‍රායෙල් ජනතාව බේරා ගැනීමට දෙවියන් වහන්සේ විසින් කවුරුන් පාවිච්චි කලේද?
4) වර්තමාන සමාජය තුලදී දැකිය හැකි මිනිසා විසින් සිදුවූ අයහපත් දේවල් මොනවාද?
5) සමාජයේ අයහපත් තත්ත්ව හේතුකොටගෙන සමාජයේ ඇතිව ඇති අයහපත් තත්ත්ව මොනවාද?
6) දෙවියන් වහන්සේ විසින් මිනිසුන් වන අපගෙන් බලාපොරොත්තු වන්නේ යහපත් හා කීකරු ජීවිතයකි. උදාහරණ දක්වමින් පහදන්න
7) පීඩා හෙලා දකිමින් ඉන්දියාවේ නිදහස් අරගලයට අවිහිංසාවාදය ප්‍රතිපත්තිය කරගනිමින් කටයුතු කලේ කවුරුන්ද?
8) කළු සුදු වර්ණ බේදයට එරෙහිව කටයුතු කල තැනැත්තා කවුරුන්ද?
9) ජේසුස් වහන්සේ විසින් එදා ජුදෙව් සමාජය තුලදී පව්කාරයන් ලෙස කොන් කරනු ලැබූවවුන් පිලිගත් සේක. එලෙෂ පිළිගත් දෙදෙනෙක් නම් කරන්න
10) එමෙන්ම ජේසුස් වහන්සේ විසින් සුව මෙහෙය මගින් පීඩිත වූවන් මුදාගත් සේක. එලෙෂ සුව සිදුවීම් වූ අවස්ථාවන් 5ක් ලියන්න
11) එමෙන්ම ජුදෙව් සමාජ සිරිත් හා පසුබිම අභියෝගයට ලක් කරමින් ජේසුස් වහන්සේ කටයුතු කල අවස්ථාවලට නිදසුන් සඳහන් කරන්න
12) එදා ජුදෙව් සමාජයේ විලසින් වර්තමාන සමාජයේද මිනිසුන් පීඩාවට පත්වනු ලබයි. එම පීඩාවන් විඳින මිනිසුන් දිරිමත් කිරීමට කිතුණු අපට කල හැකි දේ විස්තර කරන්න

## 23 සමාජ සාධාරණත්වය කරා

1) දිවැසිවර ආමොස් විසින් දිවැසිවර සේවය සිදුකලේ කුමන රාජ්‍යයේද?

2) දිවැසිවර ආමොස්තුමාගේ උපන්ගම කුමක්ද? එමෙන්ම ඔහුගේ වෘත්තිය කුමක්ද?

3) දෙවන ජෝවම්ගේ පාලන සමයෙහි ජනතාව ආර්ථික වශයෙන් සමාජ ප්‍රාන්තර දෙකකට බෙදුණි. එලෙස වීමට හේතු සඳහන් කරන්න

4) එමෙන්ම ආමොස්තුමන් විසින් දුගී ජනතාව ධනපති වෙළඳුන් හට දැරූ ආකල්පය කුමක්ද?

5) ආමොස්තුමා සමාරිත ධනපතීන්ගේ බිරින්දෑවරු කෙලෙස හැඳින්වූවාද?

6) එම ධනපතීන් හට ආමොස් පවසන පරිදි දෙවියන් වහන්සේගේ විනිශ්චය කෙබඳු වේද?

7) ඉශ්‍රායෙල්වරු අයුක්තිසහගත ජීවිත ගත කරමින් ආගමික කාර්‍යයන් වල නියැලුණු අතර එලෙස ආගමික චාරිත්‍ර කලහොත් දෙවියන් වහන්සේගේ කැමැත්ත කෙබඳු වන්නේදැයි ආමොස් විසින් පැවසුවේද?

8) ආමොස් තම දිවැසිවලියේ දේව විනිශ්චය පිළිබඳ සඳහන් කරනාවිට දෙවියන් වහන්සේව කෙලෙස හැඳින්වූවේද?

9) දේව ආරක්ෂාව, දේව බලය, මහිමය හිමිවීමට අපගේ සිත් කුමන ආකාර විය යුතුද?

10) අයුක්ති සහගත ක්‍රියාවකදී කිතුණුවන් වන අප කෙලෙස හැසිරිය යුතුද?

11) ජේසුස් වහන්සේගේ නාසරෙත් දේශනයේ ප්‍රධාන වශයෙන් ගම්‍ය වන දේ කුමක්ද?

12) අප යුක්තිය හා සාධාරණත්වයේ මාර්ග විවර කිරීමට හා සොයාගැනීමට කිතුණුවකු ලෙෂ අප කුමක් කල යුතුද?

13) යුක්තිය සාධාරණත්වය උදෙසා කිතුණු අපගේ පෞද්ගලික කැපවීම කෙලෙස විය යුතුද?

## 24 පිවිතුරු දිවියක් කරා

1) දිවැසිවර යෙසායාගේ දේව කැඳවීම ලබන අවස්ථාවේදී ඔහු සිටි දේශයේ පසුබිම කෙසේද?
2) යෙසායාගේ දිවැසිවැකිවල පරිදි දෙවියන් වහන්සේ අපේක්ෂා කල දේ කුමක්ද?
3) දිවැසිවර යෙසායා දිවැසිවරයෙකු ලෙස කැඳවීම ලබන්නේ කොහි සිටියදීද?
4) යෙසායා තම පාපය පිලිබඳ ගැඹුරු අවබෝධයක් ලබාගත් අයෙකි. එම අවබෝධය මගින් ඔහු පිලිබඳ සිතා සිටියේ කෙලෙසද?
5) යෙසායා දෙවියන් වහන්සේ පිළිබඳ දර්ශණයක් දුටුසේක. එම දරිශණය කෙටියෙන් විස්තර කරන්න
6) දෙවියන් වහන්සේගේ ශුද්ධකම අපට ළඟා කරගත හැක්කේ කෙසේද?
7) යෙසායාට දේව ශුද්ධත්වය ලැබුණේ කුමක් ඉටුකිරීම සඳහාද?
8) දාවිත් රජද තම පාපය අවබෝධ කරගත් තැනැත්තෙකි. තම පාපය හේතුවෙන් දෙවියන් වහන්සේ සමඟ ඔහු සැබෑ සම්බන්ධකමක් අවශ්‍ය විය. ඒ සඳහා දාවිත් දෙවියන් වහන්සේගෙන් ආයාචනා කලේ කෙලෙසද?
9) දෙවියන් වහන්සේගෙන් පිවිතුරු ජීවිතයක් ලබන්නාගේ ජීවිතය කෙබඳු වියයුතුද?
10) මිනිසා දෙවියන් වහන්සේට අකීකරු වීම තුලින් මිනිසාට ඇතිවන තත්ත්වයන් පැහැදිලි කරන්න

## 25 නවෝදයේ අරුණලු

1) දිවැසිවර මීකා දිවැස් වැකි ප්‍රකාශ කරනු ලැබුවේ කුමන රාජ්‍යයේද?
2) දිවැසිවර මීකාගේ දිවැසිවැකි වල අන්තර්ගත ප්‍රධාන තේමාව කුමක්ද?
3) මීකා 'මතු දවස' යන වචනය යෙදීමෙන් දෙවියන් වහන්සේ කිසියම් සුවිශේෂ කාලයක සාමය පිහිටුවන බව පවසයි. එය සිදුවන්නේ කුමන සිථානයකද?
4) මීකා 4:3 පදය තුල දේව සෙනඟ තුල ජනිත වන සාමකාමී ජීවන රටාව කෙලෙෂ පැහැදිලි කර තිබේද?
5) සාමයෙහි ප්‍රතිඵලය වන්නේ කුමක්ද? එහි ස්වභාවය මීකා කෙලෙස පැහැදිලි කරනු ලැබුවේද? එම ප්‍රතිඵලය කා වෙතින් පහල වන්නේද?
6) 'මිදි වත්ත' යන රූපකය උපමා කර තිබෙන්නේ කාහටද? එලෙස උපමා කිරීමෙන් දෙවියන් වහන්සේ බලාපොරොත්තුවන්නේ කුමක්ද?
7) හෙබ්‍රෙව් විසින් සාමය යන්න අර්ථ දක්වන්න. එම අර්ථයෙහි පුළුල් නිර්වචනය කුමක්ද?
8) කිතුණුවන් වන අපගේ ජීවිතය සාමය තුල කෙලෙස විය යුතුදැයි කෙටියෙන් විස්තර කරන්න
9) තම දෑත් පිළිබඳව නොතකමින් දකුණු අප්‍රිකාවේ සුදු කලු අන්තර් සම්බන්ධතාවයෙහි නියැලුණු පුද්ගලයා කවුරුන්ද? ඔහුගේ ජීවිතයෙන් ලැබිය හැකි ආදර්ශ මොනවාද?
10) අප රට තුළද සාමය උදෙසා මෑත කාලයේ වෙහෙස වූ දේවගැතිවරු කිහිපදෙනෙක් නම් කරන්න